තනතුරු ඇබෑර්තු

නාවලපිටිය නගර සභාව

නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම

නාවලපිටිය නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරුවලට බඳවා ගැනීමට මධ්‍යම පළාත් පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුර	*පුරප්පාඩු සංඛ්‍යාව*
රියදුරු (දෛනික)	04

බඳවා ගැනීමේ සුදුසුකම් :

01.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය (දෛනික පදනම මත)

01.2 *සුදුසුකම්* :

01.2.1 ***අධ්‍යාපන සුදුසුකම්*** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

01.2.2 ***වෘත්තීය සුදුසුකම්*** : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

තනතුරු නාමය	*සම්පූර්ණ කළ යුතු සුදුසුකම්*
රියදුරු	තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට අවම වශයෙන් වසර 03 කට පෙර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2009.03.11 දිනට පෙර නිකුත් කරන ලද 'ඒ' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

01.2.3 ***පළපුරුද්ද*** : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය)..

01.2.4 ***කායික සුදුසුකම්*** :

I. සෑම අපේක්ෂකයකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 1/2ක් විය යුතුය.

01.2.5 ***වෙනත්:***

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ පදිංචිකරුවන් විය යුතුය. වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයකු විය යුතුයි.

III. මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

IV. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ *නිවේදනයේ/ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

V. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

01.3 ***වයස :***

:

01.3.1 අවම වයස් සීමාව : අවුරුදු 18 යි
01.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 45 යි

01.4 ***බඳවා ගැනීමේ ක්‍රමය :***

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

01.4.1 ***ලිඛිත විභාගය*** : පහත සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන් ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය

1. විභාගය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*මුළු ලකුණු*	*මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	පැය 01	100	40%
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	පැය 01	100	20%

2. මෙම පරීක්ෂණය නාවලපිටිය නගර සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.
3. තරඟ විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.
4. සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.
5. **විභාගය සඳහා විෂය නිදෙර්ශය :**

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*
1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.
2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

01.4.2 *වෘත්තීය පරීක්ෂණය:*

පරීක්ෂා කර ලබාදෙනු ලබන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය*
1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය	40	ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
2. මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම	40	
3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම	20	
මුළු ලකුණු සංඛ්‍යාව	100	

01.5. *අයදුම් කළ යුතු ආකාරය:*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි "12x8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර **"නාවලපිටිය නගර සභාවේ රියදුරු (ප්‍රාථමික ශිල්පීය) තනතුරේ පුරප්පාඩු සඳහා දෛනික වැටුප් මත බඳවා ගැනීම" ලෙස** අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා, **2026.11.27** වැනි දිනට පෙර **"ලේකම්, නගර සභාව, නාවලපිටිය"** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය.**නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**අයදුම්පත් සමග පහත ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය.:-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
4. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරි සහතිකය;
5. මෑතකදී ගත් චරිත සහතික 02ක්;
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික;
7. පොලිස් වාර්තාව හා වලංගු රියදුරු බලපත්‍රය.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර, කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නාවලපිටිය නගර සභාවේ ලේකම් සතුය.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, සිංහල නිවේදනයට අනුව අදාළ කරුණු බලපැවැත්වේ.

ලේකම්,

නගර සභාව, නාවලපිටිය.

2026 ඔක්තෝබර් මස 27 වැනි දින,

නාවලපිටිය නගර සභාවේ දී ය.